හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව - 2013
නුවරඑළිය දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 ව්‍යාචන මතය
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකිවිය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.
---------------------------------------------------------------------

ප්‍රදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙලකර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගන්නා ලද ණය මුදලේ රු.15,660,211ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.14,810,968ක් ලෙස දැක්වීම හේතුවෙන් ණය ප්‍රාග්ධනය රු.849,243ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.121,102ක කර්මාන්ත ණයහිමි ශේෂයක් හා රු.83,587ක විවිධ ණයහිමි ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ). අංක 109 ප්‍රාග්ධන වැය විෂයට අදාළ ලෙජර් ගිණුමේ රු.695,289ක එකතුව රු.860,289ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.165,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාගයක් ලෙසට ලැබී ගබඩාවේ පැවති රු.96,579ක් වටිනා කසළ බඳුන් 213ක වටිනාකම ලැබුණු පරිත්‍යාගවලින් අත්හැරී තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතුව රු.165,281ක් වූ ලැබීම් සහ රු.15,500ක් වූ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් සහ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ). 2008 දෙසැම්බර් 31 දින බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන රු.25,574ක හඳුනානොගත් වෙනස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(උ). ඥානසල පාඨමාලා සඳහා ලැබුණු රු.51,900ක ශුද්ධ ආදායම රු.45,357ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් ආදායම රු.6,543ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ). 2013 වර්ෂයට අදාළ විගණන ගාස්තුව සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ). සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු සභාව සතු ජංගම නොවන වත්කම් විෂයයන් 44ක වටිනාකම් ආගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්.

-----------------------------

ගිණුම් විෂයයන් 02කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ රු.4,129,391ක එකතුව ගිණුම්වලට අදාළ උපයෝගී ලේඛණ අනුව රු.3,194,278ක ශේෂ එකතුව සමඟ සැසැඳීමේදී රු.935,113ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ 02ක එකතුව රු.14,154,565ක් විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු.01ක කාලයක් ඉක්මවා ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.9,753,606ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ රු.94,890,328 ක ගිණුම් ශේෂ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකිවිය.

1.3.7 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 හා 04 වගන්ති | ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිට ස්ථානමාරුවීම, සේවය හැරගිය හා මියගිය සේවකයන් 12 දෙනෙකුගෙන් අයනොවී පවතින රු.170,092ක ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 12(1) ඒ වගන්තිය | ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර ඒවා නැවැත්වීමට හෝ නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන සභාවට ලැබිය යුතු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1. මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,390,754ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,426,613ක් වී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2013.01.01 දිනට හිඟය | 2013.01.01 දිනට හිඟයෙන් අයකිරීම | 2013 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2013.12.31 දිනට හිඟ<br>2013.01.01 දිනට පැවති හිඟයෙන් | <br>වර්ෂයේ බිල්කිරීම් වලින් | <br>මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 736,527 | 363,158 | 1,184,182 | 537,630 | 373,369 | 646,552 | 1,019,921 |
| බදු කුලී | 1,097,084 | 315,630 | 1,936,652 | 956,108 | 781,454 | 980,544 | 1,761,998 |
| බලපත්‍ර ගාස්තු | - | - | 1,345,040 | 1,358,790 | - | 13,750 | 13,750 |
| වෙනත් | 891,392 | 616,040 | 2,150,594 | 1,738,218 | 275,352 | 412,376 | 687,728 |

2.2.2 වරිපනම් බදු
----------------

2013 දෙසැම්බර් 31 දිනට රු.1,019,921ක අයවිය යුතු වරිපනම් බදු මුදලක් පැවතියද ඒ සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති මාලාවේ 33 වෙනි රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3. බදු කුලී.
----------

සභාව සතු කඩ කාමර 06ක් හා සතිපොල ගොඩනැගිල්ලේ පහත හා ඉහළ මාලය බදුදීමෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.663,692ක මුදලක් අයවිය යුතු අතර රිකිල්ලගස්කඩ හා හේවාහැට නගරයේ කඩ කාමර 07කින් රු.76,540ක මුදලක්ද අයවිය යුතුව පැවැතුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු.
----------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති මාලාවේ 59වන රීතිය ප්‍රකාරව සෑම වර්ෂයක් ආරම්භයේදීම ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා සියළුම ව්‍යාපාර වෙළඳ බලපත්‍ර ලේඛණයට ඇතුළත් කර බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවද, 2013 වර්ෂයේදී නියැදි පරීක්ෂාවට අනුව ආයතන 46කින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.2.5 ජල ගාස්තු.

------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු.755,679 ක් විය. ජල ගාස්තු නොගෙවන පාරිභෝගිකයන්ගෙන් ගාස්තු අයකිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.3,758,336ක මුද්දර ගාස්තු හා රු.480,750ක උසාවි දඩ මුදල් අයවිය යුතුව පැවැතුණි.

2.2.7 ප්‍රචාරන දැන්වීම් ගාස්තු

--------------------------

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 22 (අ) හා 122 - 126 වගන්තිවල බලතල අනුව හා 1988 අගෝස්තු 23 හා අංක 520/7 ගැසට් පත්‍රයේ IV(අ) අතුරු ව්‍යවස්ථාවේ 39 ඡේදයේ විධිවිධාන අනුව වර්ග අඩියකට රු.65 බැගින් ප්‍රචාරක දැන්වීම් වලින් ගාස්තු අයකළ යුතු වුවද, රිකිල්ලගස්කඩ නගරයේ ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 09කින් රු.91,148ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 වෙනත් ආදායම්

-------------------

(අ) සභා බල ප්‍රදේශය තුළ කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර 03ක් හා දුරකථන කුළුණු 06ක් ඉදිකර තිබුණද ඒවා නියාමනය කිරීම සඳහා විධිමත් අතුරු ව්‍යවස්ථා පනවා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇසළ මේලා සමයේ බදු හෝ වෙනත් පදනමක් මත ලබාදෙන දේපළ පිළිබඳ සැලැස්මක් හා ආදායම් අයකර ගැනීමේ පදනම පිළිබඳව හා අයකරගත් ආදායම පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොකළ අතර, ඇසළ මේලා සැණකෙළිය සඳහා ප්‍රාදේශීය සභා දේපළ ලබාදීමේදී ගිවිස ගෙන තිබූ ආදායම්ද විධිමත්ව අයකර නොගැනීම නිසා රු.39,150ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) සභාවේ 2011 ඔක්තෝබර් 06 දිනැති අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කුලීරථ නැවතුම් සඳහා බලපත්‍රයක් ලබා නොගැනීම හේතුවෙන් 2012 වර්ෂයේ ලියාපදිංචි වී තිබුණු ත්‍රී රෝද රථ 424න් ලැබිය යුතු රු.508,800ක ආදායමක් අහිමිවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය සඳහා අලුතින් ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීමටද කටයුතු කර නොතිබුණි.

2.2.9 පොල බදු

--------------

2013 වර්ෂය සඳහා හේවාහැට රහතුන්ගොඩ පොළ බදුදීමේදී රු.680,000කට ටෙන්ඩරය ඉදිරිපත් කළ පළමු ටෙන්ඩර්කරු රජයේ සේවකයෙකු ලෙස ප්‍රතික්ෂේප කර රු.677,000කට දෙවන වැඩිම ටෙන්ඩර් මුදල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුට ප්‍රදානය නොකර 2013 මාර්තු 12 නැවත ටෙන්ඩර් කැඳවා එම අවස්ථාවේ රු.575,000කට වැඩිම ටෙන්ඩර්කරු ටෙන්ඩරය ප්‍රදානය නොකර රු.524,000කට ඉදිරිපත් කර තිබූ මුදලට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම් තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.
-----------------------------------

(අ). ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර බදුදීමෙන් ආදායමක් උපයාගැනීමට හැකිව තිබියදීත් සභාව සතු කඩ කාමර 05ක් වසා දමා තිබූ අතර, ගෝනගන්තැන්න උපකාර්යාල ගොඩනැගිල්ලද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා තිබුණි.

(ආ). හඟුරන්කෙත නගරයේ ඉදිකර ඇති පොදු වෙළඳසැල් ගොඩනැගිල්ල පිහිටි ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, මෙම ගොඩනැගිල්ලේ ඇති කඩකාමර බදු කරුවන් වර්ෂ ගණනාවක සිට භුක්ති විඳින නමුත් සභාව සමඟ කිසිදු ගිවිසුමකට නොබැඳී, අනවසරයෙන් දීර්ඝ කාලයක සිට බුක්ති විඳින බව නිරීක්ෂණය විය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
------------------------------

(අ). සභාවේ ජල බවුසරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සහා භූමියේ ස්වභාවික ආපදාවලට ගොදුරු වන ලෙස ගාල් කර තිබුණි.

(ආ). සභාව සතු ලීටර 1000 වතුර ටැංකි 05ක් සභාවේ භාවිතයෙන් තොරව අවිධිමත් ලෙස බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කසළ කළමනාකරණය සඳහා රු.6,645,626ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන 02ක් ඉදිකර තිබුණ ද 2013 වර්ෂයේදී මෙම මධ්‍යස්ථාන 02ක ප්‍රයෝජනයට ගැනීමක් හෝ පොහොර නිෂ්පාදනය කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

(ආ). පළාත් පාලන නොමසාරිස්ගෙන් කසළ එකතු කිරීමේ බඳුන් 225ක් සභාවට ලැබී තිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/4/450 – 11 හා 2013 ඔක්තෝබර් 22 දිනැති ලිපිය ප්‍රකාරව බඳුන් නිකුත් කිරීමට අදාල උපදෙස් දී තිබුණි. බදු නිකුත් කිරීම විධිමත්ව සිදුකර නොතිබූ අතර ලැබූ ආදායමද විගණනයට ඉදිරිපත් නොවිය. යථෝක්ත ලිපියේ 06 ඡේදය ප්‍රකාරව බඳුන් ලබාදීමේදී ලැබෙන මුදලින් චක්‍රීය අරමුදල් සංචිතයෙන් අනෙක් නිවාස සඳහාද බඳුන් ලබාදීමට හැකිබව දන්වා ඇතත්, එම ව්‍යාපෘතියද ක්‍රියාත්මක කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය.
--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 12 සිට සියයට 97 දක්වාද වියදම් විෂයයන් 08ක සියයට 08 සිට සියයට 57 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය සඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). ණයගැති ණයහිමි පාලනය.
(ඉ). වත්කම් කළමනාකරණය